# ආරම්භයේ ආරම්භය

තොමස් ඇක්වයිනාස් පූජකවරයා ජීවත්වූයේ බටහිර නූතනත්වය ඇතිවීමට පෙර දහතුන්වැනි සියවසෙහි ය. බටහිර නූතනත්වය බිහිවූයේ නව චින්තනයක් බිහිකරගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ය. මේ නව චින්තනය එක් රැයකින් ඇතිවූවා නො වෙයි. ඒ සඳහා සියවස් ගණනක් ගතවිය. පහළොස්වැනි සියවසේ ඇරඹුණු බටහිර නව චින්තනය තවමත් බටහිර, ඒ නිසා ලෝකයෙහි ම, අධිපතිවාදී චින්තනය වෙයි. ඒ චින්තනය යුදෙව්, ග්‍රීක හා කතෝලික චින්තනයන්හි එකතුවකින් නිර්මාණය වූයේ වෙයි. ඇක්වයිනාස් පූජකවරයාට ද අවශ්‍ය වූයේ මේ චින්තන තුන එකතුකිරීමට ය. ඔහු ඒ සඳහා උත්සාහගත් නමුත් ඒ අසාර්ථක විය යනු මගේ මතය වෙයි. එයට එක් ප්‍රධාන හේතුවක් වූයේ යුරෝපය එකල ඒ සඳහා සූදානම් ව නොසිටීම ය. ඇක්වයිනාස් පූජකවරයාගේ වෑයම අසාර්ථක වුව ද ඔහුගේ අදහස් පසුකාලීන ව වැදගත් විය.

යුදෙව් චින්තනයෙහි ආරම්භයක් ගැන කියැවෙයි. එහි ආරම්භයක් නැත්තේ යෙහෝවා නමින් හැඳින්වෙන දෙවියන් වහන්සේට පමණකි. දැන් ප්‍රශ්නය වනුයේ ආරම්භයක් ඇතිවූයේ කාලයෙහි ද නැත්නම් ඉන් පිටත ද යන්න ය. ආරම්භයක් ඇතිවීමට නම් කාලය තිබිය යුතු ද? එනම් යමක් ආරම්භවන්නේ කාලයෙහි ද? උදාහරණයක් ලෙස ගතහොත් අප ගොඩනැගිල්ලක් තැනීම ආරම්භකරන වෙලාවක් ඇත. ගමනක් යෑමට පිටත්වන වේලාවක් වෙයි. එහෙත් කාලය පටන්ගැනෙන්නේ ගොඩනැගිල්ල තැනීම ආරම්භකරන වේලාවට හෝ ගමන පිටත්වන වේලාවට හෝ නො වෙයි. කාලය ඉන් පෙර ද තිබී ඇත. මේ උදාහරණවලින් පැහැදිලිවනුයේ ආරම්භයක් ඇතිවනුයේ කාලයෙහි බව ය. එහෙත් ඒ සාමාන්‍ය උදාහරණ ය. දෙවියන් වහන්සේ ගැන සඳහන්කරන විට කාලය සම්බන්ධවන්නේ කෙසේ ද? එසේත් නැතහොත් සමස්ත විශ්වයේ ම ආරම්භය ගැන කිවහැක්කේ කුමක් ද?

යුදෙව් ප්‍රවාදවල ඒ ප්‍රශ්නය මැනවින් සූත්‍රගත වී ඇති බවක් නො පෙනෙයි. ග්‍රීකයන්ට ඒ ප්‍රශ්නය වැදගත් වී නොමැත. ග්‍රීක චින්තනයෙහි ස්වසිද්ධි (ප්‍රත්‍යක්ෂ - axioms) හා ඇරිස්ටෝටලීය න්‍යාය (logic) වැදගත්වෙයි. එහි යම් දැනුම් පද්ධතියක් ස්වසිද්ධිවලින් ආරම්භවෙයි. ඉන්පසු ඇරිස්ටෝටලීය ද්විකෝටික න්‍යාය යෙදීමෙන් ඒ ස්වසිද්ධිවලින් යම් යම් නිගමන ලබාගනු ලැබෙයි. යුක්ලීඩීය ජ්‍යාමිතිය ඒ සඳහා හොඳම උදාහරණය වෙයි. යුක්ලීඩීය ජ්‍යාමිතිය පටන්ගැනෙන්නේ ස්වසිද්ධි ප්‍රකාශකිරීමෙන් ය. ඉන්පසු ඒ ස්වසිද්ධිවලින් ඇරිස්ටෝටලීය න්‍යාය උපයෝගී කරමින් විවිධ ප්‍රමේය හා ප්‍රතිඵල ලබාගැනෙයි. ප්‍රමේය සත්‍යවන්නේ ස්වසිද්ධි සත්‍ය නම් ය. එහෙත් ස්වසිද්ධිවල සත්‍යතාවය ගැන කිසිවක් නො කියැවෙයි. ස්වසිද්ධිවල සත්‍යතාවය ප්‍රශ්න නොකෙරෙන්නේ යැයි කීම නිවැරදි ය. ස්වසිද්ධි ප්‍රශ්නයකින් තොරව ම සත්‍යයැයි පිළිගැනෙයි. ස්වසිද්ධියක් එයට වඩා මූලික වූ වෙනත් ස්වසිද්ධියකින් හෝ ස්වසිද්ධි කිහිපයකින් හෝ ලබාගත නො හැකි ය. එසේ ලබාගත හැකිනම් එය තවදුරටත් ස්වසිද්ධියක් නො වෙයි.

කතෝලික චින්තනයෙහි මෙයට වඩා වෙනස්කම් තිබුණි. එහි න්‍යාය ඇරිස්ටෝටලීය ද්විකෝටික න්‍යාය නො වී ය. කතෝලික චිනතනයෙහි න්‍යාය ත්‍රිකෝටික න්‍යාය වෙයි. ඒ නිසා ම මෙන් එහි ආරම්භය ගැන ඇති අදහස් ද්විකෝටික න්‍යාය බලපාන චින්තනයක ඇති ආරම්භයෙන් වෙනස් වෙයි. ද්විකෝටික චින්තනයෙහි පද්ධතියක ආරම්භය එක් ලක්ෂ්‍යයක වෙයි. ඉන්පසු ඒ ලක්ෂ්‍යයෙන් ඉවතට යන පද්ධතිය රේඛාවක් දිගේ මෙන් විකාශය වෙයි. පද්ධතියට නැවතත් අවකාශයෙහි හා කාලයෙහි ආරම්භක ලක්ෂ්‍යයට පැමිණිය නො හැකි ය. පද්ධතියක් ආරම්භ ලක්ෂ්‍යයට (ප්‍රදේශයට) නැවතත් ආපසු නොඑන්නේ දැයි කිසිවකුට ප්‍රශ්න කළ හැකි ය. සරල අනුවර්ති චලිතයෙහි යෙදෙන ඔරලෝසුවේ බට්ටා නැවත නැවත පටන්ගත් තැනට ආපහු පැමිණෙයි. එහෙත් එසේ සිදුවන්නේ අවකාශයෙහි ය. කාලයෙහි එය නො සිදුවෙයි. ඔරලෝසුවේ බට්ටාට පටන්ගත් කාලයට ආපහු පැමිණිය හැකි නො වෙයි.

යුදෙව්වන්ගේ යෙහෝවා දෙවියන් වහන්සේ ලෝකය, එනම් අද කතාකරන අයුරින් විශ්වය, මවා ඉන් වෙන් විය. කලින් සඳහන්කර ඇති ආකාරයට මේ දේව නිර්මාණ සංකල්පය වෛදික දේව (බ්‍රහ්මන්) නිර්මාණ සංකල්පයෙන් වෙනස් වෙයි. බ්‍රහ්මන් තමන් මැවූ ලෝකයෙන් වෙන් නොවනවා පමණක් නොව, බ්‍රහ්මන් ලෝකයම ද වෙයි. එමෙන් ම බ්‍රහ්මන් විෂ්ණු දෙවියන් ලෙස නැවත නැවත ලෝකයට ආපසු පැමිණෙයි. ද්විකෝටික න්‍යායක එවැන්නක් නො සිදුවෙයි. එහි දී බ්‍රහ්මන් තමන් මැවූ ලෝකයෙන් වෙන් වෙයි. එයට හේතුව ද්විකෝටික න්‍යායෙහි බ්‍රහ්මන්ට ලෝකය

© Prof. Nalin De Silva

මෙන් ම ලෝකය නොවීමට ද නො හැකිවීම ය. ත්‍රිකෝටික න්‍යායෙහි බ්‍රහ්මන්ට ලෝකය වීමට ද ලෝකය නොවීමට ද හැකි ය. එමෙන් ම බ්‍රහ්මන්ට ශිව විෂ්ණු ඊශ්වර ආදී විවිධ ස්වරූප ගැනීමට ද විෂ්ණුට විවිධ ස්වරූපවලින් තමන් පවත්වාගෙන යන ලෝකයට ම ඒමට ද හැකි ය. ඒ සියල්ල කළ හැකි වන්නේ ත්‍රිකෝටික න්‍යාය වලංගුවන චින්තනයක ය.

කතෝලික චින්තනයෙහි දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ ම පුත්‍රයා ලෙස මරියතුමියගේ කුසින් උපදියි. මෙය ද සිදුවන්නේ ත්‍රිකෝටික න්‍යාය බලපාන චින්තනයක ය. දෙවියන් වහන්සේ තමන් වහන්සේ ම වන අතර තමන් වහන්සේගේ පුත්‍රයා ද වෙයි. එමෙන් ම විෂ්ණු දෙවියන් (බ්‍රහ්මන්) මෙන් මිනිස් වෙසකින් ලොව උපදියි. විෂ්ණු දෙවියන් ක්‍රිෂ්ණ, රාම ආදී වේශවලින් ලෝකයේ ඉපදුණු ආකාරයට යෙහෝවා දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේගේ වේශයෙන් ලෝකයෙහි ඉපදෙයි. කතෝලික චින්තනයට වෛදික චින්තනයේ බලපෑම ඉතා පැහැදිලි ය. මෙවැනි චින්තනයක් චක්‍රීය චින්තනයක් වෙයි. එයට ප්‍රධාන ම හේතුව එවැනි චින්තනයක වලංගුවන ත්‍රිකෝටික න්‍යාය ය.

කලින් සඳහන් කර ඇති ආකාරයට ත්‍රිකෝටික චින්තනයක A මෙන් ම ~A ද සත්‍ය වෙයි. (විස්තර සඳහා මගේ ලෝකය බලන්න.) එහි ප්‍රතිඵලයක් ලෙස දෙවියන් වහන්සේ යනු දෙවියන් වහන්සේ ය යන්න මෙන් ම දෙවියන් වහන්සේ යනු උන්වහන්සේගේ පුත්‍රයා ය යන්න ද සත්‍ය වෙයි. එමෙන් ම ආරම්භක ලක්ෂ්‍යයක් ආරම්භක ලක්ෂ්‍යය නොවීමට ද හැකි ය. එහි ප්‍රතිඵලය වනුයේ ආරම්භක ලක්ෂ්‍යයට නැවත පැමිණීමට හැකිවීම ය. එනම් පද්ධතියක ඒක රේඛීය බව නැති වී එය චක්‍රීය වීම ය. වෙනත් වචනවලින් කියන්නේ නම් පද්ධතියට ආරම්භයක් නොමැති වීම ය.

ඇක්වයිනාස් පූජකවරයාට සිදු වූයේ ද්විකෝටික න්‍යාය බල පෑ ග්‍රීක චින්තනයත් ත්‍රිකෝටික න්‍යාය බල පෑ කතෝලික චින්තනයත් එකතු කිරීම ය. එය නොකළ හැකි දෙයක් නො වෙයි. එහෙත් එයට පළමුව න්‍යාය පිළිබඳ ගැටළුව විසඳාගත යුතු වෙයි. ඇක්වයිනාස් පූජකවරයාට ඒ පිළිබඳ සවිඥානික හෝ අවිඥානික හෝ හැඟීමක් තිබිණි යැයි සිතිය නොහැකි ය. එබැවින් ම ඔහුගේ ව්‍යාපාරය අසාර්ථක වීය යන්න මගේ නිගමනය වෙයි. කෙසේ වෙතත් පහළොස්වැනි සියවසට පසු යුරෝපීය පඬුවෝ සාර්ථක ව මේ ගැටළුව විසඳා ගත්හ. ඔවුන් ඒ විසඳාගත්තේ ත්‍රිකෝටික න්‍යාය ඉවත්කර නව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ද්විකෝටික න්‍යාය මත පදනම් කිරීමෙන් ය. කතෝලික ආගමට විරුද්ධව කතෝලික නොවන ක්‍රිස්තියානි ආගම් බිහිවූයේ ද ඒ නව චින්තනයත් සමග ය. ක්‍රිස්තියානි ආගම්වල මරියතුමියට වැදගත් තැනක් අහිමිවීම අහම්බයක් නො වෙයි. මරියතුමිය යනු දෙවියන් වහන්සේට මිනිස් වෙසක් ගෙන ලොවට බිහිවීමට උපකාරී වූ මැණියන් ය. මේ කතෝලික චින්තනයෙහි ත්‍රිකෝටික න්‍යාය බලපාන ප්‍රධාන ම තැනක් වෙයි. ත්‍රිකෝටික න්‍යාය ඉවත්කිරීමේ දී නව ක්‍රිස්තියානි ආගම්වලින් මරියතුමිය ද ඉවත්කිරීමට සිදුවෙයි.

මෙහි දී නොකියාම බැරි තවත් කරුණක් වෙයි. මෙරට උගතුන් චින්තනය යන සංකල්පය පිළිගැනීමට මැළිකමක් (එය මැළිකමකට වඩා දේශපාලන විරෝධයක් විය හැකි ය.) දැක්වුව ද, ඉහත සඳහන් කරුණුවලින් පෙනී යා යුත්තේ විවිධ සංසිද්ධි තේරුම්ගැනීමට ඒ සංකල්පය කෙතරම් උපකාරීවන්නේ ද යන්න ය. එහෙත් නොකියාම බැරි කරුණ එය නො වෙයි. පහළොස්වැනි සියවසෙන් පසු බටහිර නව චින්තනයක් ඇති වුව ද කතෝලික චින්තනය මුළුමනින් ම මැකී ගියා නො වෙයි. විශේෂයෙන් ම ඉතාලිය, ප්‍රංශය, ජර්මනිය ආදී බටහිර යුරෝපීය කතෝලික රටවල ද පෝලන්තය ආදී නැගෙනහිර යුරෝපීය කතෝලික රටවල ද කතෝලික චින්තනය අද පවා පවතින බව පැහැදිලි ය. බටහිර යුරෝපයේ නව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය බිහිවීමේ දී ත්‍රිකෝටික න්‍යාය ඉවත්කෙරී ද්විකෝටික න්‍යාය මත පමණක් පදනම් වූ බැව් ඉහත සඳහන් කෙරී ඇත. එහෙත් ඉහත කී රටවල කතෝලික චින්තනය නොමැකුණු බැවින් ඒ රටවල ත්‍රිකෝටික න්‍යාය ද ඇතැම් බුද්ධිමතුන් අතර යම් ප්‍රමාණයකට භාවිතා විණි.

සංස්කෘතියක හෝ සභ්‍යත්වයක හෝ අධිපතිවාදී චින්තනය හා න්‍යාය කුමක් වුව ද බුද්ධිමතුන් කිහිප දෙනකු අතර වෙනත් චින්තන හා න්‍යාය තිබිය හැකි ය. එහෙත් ඒ බුද්ධිමත්තු සමාජයේ සුළුතරයක් වෙති. ඔවුන්ගේ අදහස් බොහෝ විට සාමාන්‍ය ජනතාවට කාන්දු නො වෙයි. පැරණි ප්‍රාග් වෛදික භාරතයේ චින්තනයේ න්‍යාය චතුස්කෝටික වී යැයි සිතීමට තුඩු දෙන කරුණු වෙයි. එහෙත් භාරතයට වෛදිකයන්ගේ පැමිණීමෙන් පහුව ඇති වූ වෛදික චින්තනයේ න්‍යාය චතුස්කෝටිකයෙන් ත්‍රිකෝටිකයට මාරු විය. එයට ප්‍රධාන හේතුව වන්නට ඇත්තේ වෛදිකයන්ගේ

© Prof. Nalin De Silva

ආත්මවාදය සමග චතුස්කෝටිකය සංගත නො වීම ය. එහෙත් චතුස්කෝටිකය භාරතයෙන් අතුරුදහන් නොවී ය. බුදුන් වහන්සේගේ ධර්මය සඳහා චතුස්කෝටිකය අවශ්‍ය න්‍යාය විය. චතුස්කෝටිකය බෞද්ධ න්‍යාය ලෙස හැඳිනගැනීමට එය හේතුවක් වූවා විය හැකි ය. එහෙත් මෙයින් අදහස් කෙරෙන්නේ චතුස්කෝටිකය නිවනේ න්‍යාය යන්න නොවන බව අවධාරණය කළ යුතු වෙයි. නිවන් අවබෝධයෙහි දී චතුස්කෝටිකය ද ප්‍රතික්ෂේප වෙයි.

පැරණි ග්‍රීසියේ චින්තනයේ න්‍යාය ඇරිස්ටෝටලීය ද්විකෝටික න්‍යාය වුව ද, භාරතීය න්‍යායන්ගේ ආභාසය ලැබූ බුද්ධිමතුන් කිහිප දෙනකු එහි ජීවත් වී ඇති බවට සාධක වෙයි. මෙරට පාසල් සිසුන් වුව ද දන්නා පෛතගරස් පඬුවාණෝ ඉන් එක් අයෙක් වූහ. හෙරික්ලිටස් විද්වතා තවත් කෙනෙක් විය. අද බටහිරයන් සඳහන් කරන අපෝහකයේ හෙවත් දයලෙක්තිකයේ ආරම්භකයා ඔහු යැයි කියැවෙයි. එහෙත් ඔහුගේ අපෝහකය යනු ත්‍රිකෝටික න්‍යායෙහි බිංදු මාත්‍රයක් පමණකි. කතෝලික චින්තනයෙහි ද න්‍යාය වූයේ ත්‍රිකෝටිකය බවත් එයට ද වෛදික චින්තනය බලපා ඇති බවත් ඉහත සඳහන් වී ඇත. ජර්මනිය ආදී කතෝලික රටවල මේ චින්තනය ඉතිරි වී තිබුණි. පසු කලෙක හෙගල් පඬිවරයාටත් ඔහුගේ ගෝලයකු වූ කාල් මාක්ස් විද්වතාටත් කතෝලික චින්තනයෙහි ත්‍රිකෝටික න්‍යාය බලපෑවේ ය. පහළොස්වැනි සියවසේ ආරම්භ වූ බටහිර යුරෝපයේ නව චින්තනය වෙනස් අතකට යොමුකිරීමට, එක්තරා ආකාරයකින් ගතහොත් ඒ නව චින්තනයෙන් කැඩීමට, හෙගල් මාක්ස් පඬිවරු උත්සාහ කළහ. එය බුද්ධිමය ව්‍යායාමයක් ලෙස ගතහොත් අසාර්ථක වුව ද දේශපාලන වශයෙන් තාවකාලික ජයග්‍රහණ ලැබීමට සමත් විය. ජර්මනිය, ඉතාලිය ආදී රටවල බිහි වූ ෆැසිස්ට්වාදී රාජ්‍ය ද පෝලන්තයේ හා ජර්මනියේ මාක්ස්වාදයේ ආභාසයෙන් නැගෙනහිර යුරෝපීය රටවල ඇති වූ මාක්ස්වාදී රාජ්‍ය ද ත්‍රිකෝටික න්‍යාය මත පදනම් වූ කතෝලික චින්තනයෙහි තාවකාලික ජයග්‍රහණ විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva